# ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතු කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (කුලියාපිටිය අධ්‍යාපන කලාපය ඇසුරින්)

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ
අධ්‍යාපන දර්ශනපති පශ්චාත් උපාධි පාඨමාලාවේ අවශ්‍යතා
පූර්ණය සඳහා ඉදිරිපත් කෙරෙන
නිබන්ධනයකි

UCLIB
544761

ගුණවර්ධන දිසානායකලාගේ සේනාරත්න

2004/ Mphil/20

දිනය-; 2007-02-06

STOCK VERIFICATION
15 OCT 2013
544761

## සාරාංශය

**ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතු කළමනාකරණය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්**

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සම්පත් පාදක අධ්‍යාපනයේදි පාසල් පුස්තකාලවලට වැදගත් තැනක් හිමිවේ. නව තාක්ෂණයේ දියුණුවත් සමගම විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවක් ඇති වුණි. විද්‍යාත්මක තොරතුරු සන්නිවේදනය වේගවත්ව හා කාර්යක්ෂමව පැවැත්වීමේ අවශ්‍යතාවය ඉස්මතු වීම සහ අන්තර් ජාලය බිහිවීමත් සමගම සමස්ත ලෝකයේ විශාරද තොරතුරු ගලා යෑමේ සහ පරිහරණයේ කැපී පෙනෙන වෙනසක් ඇතිවී තිබේ. පාසල් සිසුන්ගේ විධිමත් අධ්‍යාපන ක්‍රියාවලිය කාර්යක්ෂම හා ඵලදායි කර ගැනීමට සිසුන් තුළ තොරතුරු සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම අවශ්‍යවේ. ඒ සඳහා පාසල් පුස්තකාලය බෙහෙවින් ප්‍රයෝජනවත් වන අතර එහි ඇති තොරතුරු මූලාශ්‍ර එකතුව නිසි පරිදි කලමනාකරණය කර තිබිමද අවශ්‍යය. මේ අනුව මැනවින් සංවිධානය වූ ප්‍රමාණවත් තොරතුරු මූලාශ්‍ර එකතුවක් සහිත පාසල් පුස්තකාලයක් තුළින් පාසල් පාඨක ප්‍රජාවගේ තොරතුරු සාක්ෂරතාව සංවර්ධනයට කළ හැකි සේවය අති මහත්‍ය. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුව කළමනාකරණය කර ඇති ආකාරය විමසා බලන ලද මෙම අධ්‍යයනයේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

- පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුවේ ස්වභාවය විමසා බැලීම
- පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුව කලමනාකරණය කර ඇති ආකාරය විමසා බැලීම
- පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුව පාසල් පාඨකයින් භාවිතා කරන ආකාරය විමසා බැලීම
- පාසල් පාඨක ප්‍රජාවගේ තොරතරු කුසලතා සංවර්ධනයට ගුරු පුස්තකාලයාධිපතිවරුන් ගෙන ඇති ක්‍රියා මාර්ග විමසා බැලීම
- පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුව කලමනාකරණය සම්බන්ධව ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ආකල්ප විමසා බැලීම

මෙම පර්යේෂණය සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ ස්ථරගත අහඹු නියැදි ක්‍රමය අනුගමනය කළ අතර ඉලක්ක ජනගහනය ලෙස කුලියාපිටිය අධ්‍යාපන කලාපයේ දෙමළ මාධ්‍ය පාසල් හා 3 වර්ගයේ පාසල් හැර ඉතිරි පාසල් තෝරා ගැනිණි. ඒ අනුව නියැදියට 1AB වර්ගයේ පාසල් 05 ක් ද, 1 C වර්ගයේ පාසල් 10 ක් සහ 2 වර්ගයේ පාසල් 15 ක් ද වශයෙන් පාසල් 30 ක් තෝරා ගැනුණි. මෙම පාසල්වල ගුරු පුස්තකාලයාධිපතිවරුන් 30 දෙනාද,

ආකල්ප පරීක්ෂණය සඳහා ගුරුවරුන් 90 ක් සහ සිසුන් 180 ක්ද නියැදියට ඇතුලත් විය. මෙම අධ්‍යයනයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා, (ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා) නිරීක්ෂණය, ආකල්ප පරීක්ෂණ, (ගුරුවරුන් සහ සිසුන් සඳහා) සහ ලිපි ලේඛන පරීක්ෂාව යන දත්ත රැස් කිරීමේ ක්‍රම ශිල්ප යොදා ගැනුණි.

මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ කරුණු ලෙස පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතුවෙන් වැඩි කොටස මුද්‍රිත මාධ්‍යයන්ට අයත් වූ අතර ශ්‍රව්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය හා විද්‍යුත් මාධ්‍යයන්ට වැදගත් තැනක් හිමි වී නොතිබීම, පාසල් පුස්තකාලයක පවත්වා ගෙන යායුතු ලිපි ලේඛන අතුරින් ක්‍රමවත්ව නඩත්තු කර තිබුණේ පරිග්‍රහණ ලේඛනය පමණක් වීම, පාසල් පුස්තකාලයකට අවශ්‍ය නිතිරීති ක්‍රියාත්මක කිරීම හා තොරතුරු මූලාශ්‍ර එකතුව සංවර්ධනයට වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම බොහෝ පාසල් පුස්තකාලවල දුර්වල මට්ටමක පැවතීම, තොරතුරු මූලාශ්‍ර එකතුව සංවර්ධනයට මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම, පුස්තකාලය සතු ඉඩකඩ හා ලී බඩු ප්‍රමාණවත් නොවීම, ගුරු පුස්තකාලයාධිපතිවරුන්ට ඉගැන්වීමේ කටයුතු පැවරී තිබීම නිසා වැඩි වශයෙන් 2 වර්ගයේ පාසල්වල පුස්තකාල කටයුතු ක්‍රමවත්ව පවත්වා ගෙන යෑමට බාධක වී තිබීම යන කරුණු හඳුනා ගත හැකි විය. එමෙන්ම පාසල් පාඨකයින්ගේ වැඩි ඉල්ලුමක් ප්‍රබන්ධ කථා, විෂයානුබද්ධ පොත් සහ පුවත්පත්වලට හිමිවී තිබූ අතර, පොත් තෝරා ගැනීම පහසු කරවීම සඳහා ඩිවි දශම වර්ගීකරණය බොහෝ පාසල් පුස්තකාලවල අනුගමනය කෙරිණි. බැහැර දෙන පොත් සංඛ්‍යාව පාසල් පුස්තකාලය සතු පොත් ප්‍රමාණය මත තීරණය වූ අතර පොත් බැහැර දීම සඳහා බ්‍රවුන් ක්‍රමය හා ලෙජර් ක්‍රමය අනුගමනය කරනු ලැබීම, පාසල් පුස්තකාලවල පාඨකයින් බැහැර දීමේ අංශයත්, කියවීම සඳහා පහසුකම් සහිත පුස්තකාලවල එම අංශයත් වැඩි වශයෙන් භාවිතා කෙරුණි.

පාසල් පුස්තකාලවල තොරතුරු මූලාශ්‍ර එකතු කළමනාකරණය පිළිබඳව ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ආකල්ප පුස්තකාලය සතු තොරතුරු මූලාශ්‍ර එකතුව පාඨකයින් සඳහා ප්‍රමාණවත්බව, එම එකතුව විධිමත්ව පවත්වා ගෙන යෑමට ඇති සැලසුම්වල ප්‍රමාණවත්බව, තොරතුරු මූලාශ්‍ර එකතුව සංවර්ධනයේදී පාඨක අවශ්‍යතා සලකා බැලීම, තොරතුරු මූලාශ්‍ර එකතුව භාවිතයට ඇති පහසුකම්වල ප්‍රමාණවත්බව, තොරතුරු මූලාශ්‍ර එකතුව පාඨකයින් භාවිතා කරන ආකාරය, පාඨක තොරතුරු අවශ්‍යතා සපුරාලීමට සහ කුසලතා සංවර්ධනයට පුස්තකාලය මගින් ලැබෙන දායකත්වය යන කරුණු ඔස්සේ ලබා ගන්නා ලද අතර මෙම කරුණු බොහොමයක් සම්බන්ධයෙන් 1 AB හා 1C වර්ගයේ පාසල්වල ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ආකල්ප ධනාත්මක ස්වරූපයක් ගත්තත් 2 වර්ගයේ පාසල්වල ගුරුවරුන්ගේ සහ සිසුන්ගේ ආකල්ප මෙම කරුණු බොහොමයක් සම්බන්ධයෙන් ඍණාත්මක ස්වරූපයක් ගැනීම මගින් පැහැදිලි වන්නේ 2 වර්ගයේ පාසල්වල පාසල් පුස්තකාලය සතු තොරතුරු මූලාශ්‍ර එකතුව 1 AB හා 1C වර්ගයේ පාසල්වල තොරතුරු මූලාශ්‍ර එකතුව හා සසඳන කළ වඩාත් අවාසිදායක තත්වයක පවත්නා බවයි.

# ABSTRACT

**Observation study of the management of information source collection in Sri lankan school Libraries**

Under the new educational reforms school Libraries take an important place in the resource – based education. With the development of the new technology there was a rapid development in the electric and electronic communication technology with the birth of the internet and the increasing necessity to maintain efficiency and to speed of the scientific information communication an outstanding change has taken place in the eminent information flow and the use of which in the whole world. It is necessary to improve the information literacy of students to make education process fruitful and efficient and for which the school library becomes very useful and a proper management of the information source collection in these also required. An immense service could be done to improve the information literacy of the school community through a well organized school library with enough collection of information sources.

**The objectives of the study, looking in to the management of the information source collection Sri lankan school Libraries are follows;**

- Inquiring in to the nature of the information source collection found in school Libraries
- Inquiring in to the management of how the information source collection of school Libraries have been done
- Inquiring in to how the information source collection in school Libraries is used by school reader
- Inquiring in to how such collection help to satisfy the information requirements of the school reader community and the step taken by the teacher librarian to the develop the information competencies of the school reader
- Inquiring in to the teacher and students attitude in relation to the information source collection management of school Libraries

For the research stratified sampling method was followed under the descriptive research access, and Tamil medium schools and all other schools except the category 3 were selected from the Kuliyapitiya education zone as the target population Accordingly, 5 schools of 1AB, 10 schools of 1C and 15 school of the category 2 were selected to be 30 schools from all. 30 teacher librarians of the schools 90 teachers and 180 students got included for the attitude test in the sample.

**The following categories of the collecting data were used to arrive at the objective**

- Interviews (for teacher librarians)
- Attitude tests (for the teacher and students)
- Examining document
- Observation

**The facts disclosed from the research were as the follows**

- The majority of the collection of the information source collection in the school Libraries were of printed elements and no important place was given to the audio visual media
- Out of the documents maintained in a school library, only inventory was properly maintained
- Implementation of the necessary rules and regulations in a school Library and programme to develop the collection of information source in most of the school Libraries were of very low level
- Insufficient financial sources for the development of information source collection, insufficient accommodation and furniture for the library, and getting teacher librarians to teach obstructed to maintain regularity in school libraries mostly of the category 2.
- A greater demand from the school readers was made for fictions and subject related books and newspapers, and Dewey decimal classification system was followed by most of the schools to ease the reader for selecting books. The number of books available in the school library and Browns method and Ledger method were followed when lending books.
- Lending section and the reading section where such facility is available for reading were mostly used by readers of school libraries.
- The attitudes of the students and the teachers, about the management of the information source collection of the school libraries, sufficiency of information source collection available in the library for readers, sufficiency of the plans made for the formal maintenance of the collection, in the development of the information source collection, attention to the readers requirements, and insufficiency of the facility available for the use of information source collection, how the information source collection is used, fulfillment of the readers information requirements and for the competency development, in what manner could the library contribute were more of positive nature, of students and teachers of 1AB and 1c school categories where as teachers and students of category 2 schools were of the negative.